# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 41 දරන
# ජාතික සත්ව උද්‍යාන පනත

---

[සහතිකය සටහන් කළේ 1982 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 65 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 41 දරන ජාතික සත්ව උද්‍යාන පනත

[සහතිකය සටහන් කළේ 1982 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 40/75

**ජාතික සත්ව උද්‍යාන පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ද, සත්ව උද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදල පිහිටුවීම සඳහා ද, ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික ව කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**කෙටි නාමය.**

1. මේ පනත 1982 අංක 41 දරන ජාතික සත්ව උද්‍යාන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ජාතික සත්ව උද්‍යාන පරිපාලනය කිරීම.**

2. (1) ජාතික සත්ව උද්‍යාන පරිපාලනය කිරීමේ කාර්ය සඳහා—

(අ) ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයා වීමට හෝ ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ බැලීමට තැනැත්තකු ;

(ආ) ජාතික සත්ව උද්‍යාන පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් වීමට හෝ ජාතික සත්ව උද්‍යාන පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් වශයෙන් වැඩ බැලීමට තැනැත්තන් ; සහ

(ඇ) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් එවැනි නිලධරයන් සහ සේවකයන්

පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා පත් කරනු ලබන සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

## I වන කොටස

### ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය කාර්ය හා බලතල

**සත්ව උද්‍යානයේ සාමාන්‍ය පරිපාලනය.**

3. (1)(මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයා, (මෙහි මින්මතු "සත්ව උද්‍යානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සත්ව උද්‍යානයේ කටයුතු හා කාර්ය අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා විසින්, සත්ව උද්‍යානයේ නියෝජ්‍ය හෝ සහකාර අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් යම් නිලධරයකු වෙත ස්වකීය බලතල අතුරින් කිසිවක් පවරනු ලැබිය හැකි ය.

**සත්ව උද්‍යානයේ අධ්‍යක්ෂවරයාගේ කාර්ය.**

4. අධ්‍යක්ෂවරයා විසින්—

(අ) කොරටු, මාවත්, ගොඩනැගිලි හා වැටවල් ඉදි කිරීම, ජල ප්‍රමාණයන් සැපයීම සහ සත්ව උද්‍යානයේ පාලනය සඳහා අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන වෙනත් වැඩ කිරීම සඳහා ;

ඒ64306—13,125 (82/09)

(ආ) සත්ව උද්‍යානයේ සිටින සතුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ;

(ඇ) වාහන ගමනාගමනය විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා ;

(ඈ) වාහන නවතා තැබීම පිණිස විශේෂ පෙදෙස් සැපයීම සඳහා ;

(ඉ) සත්ව උද්‍යානය බැලීමට පැමිණෙන අමුත්තන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ; සහ

(ඊ) සත්ව උද්‍යානය විසින් පවත්වා ගෙන යනු ලබන යම් ගොවි පළක් සහ එහි නිෂ්පාදන සුරැකීම සඳහා

සත්ව උද්‍යානය ඇතුළත පියවර ගනු ලැබිය හැකි ය.

වැරදි සහ දණ්ඩන.

5. (1) (අ) නියමිත ගාස්තුව ගෙවීම මත සත්ව උද්‍යානයේ දොරටුවේ දී නිකුත් කරනු ලබන වලංගු ප්‍රවේශ පත්‍රයක් නොමැතිව සත්ව උද්‍යානයට ඇතුළුවන ;

(ආ) අධ්‍යක්ෂවරයා විසින් හෝ යම් නියෝජ්‍ය හෝ යම් සහකාර අධ්‍යක්ෂවරයකු විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ කිරීමට අසමත් වන ;

(ඇ) වෙනත් යම් තැනැත්තකුට සත්ව උද්‍යානයට ඇතුළු වීමට හැකි වනු පිණිස තමා වෙත නිකුත් කරනු ලැබූ ප්‍රවේශ පත්‍රය විකුණන හෝ පවරන හෝ විකිණීමට හෝ පැවරීමට උත්සාහ කරන ;

(ඈ) සත්ව උද්‍යානය ඇතුළත යම් සතකුට කෑම සැපයීම දැන්වීමක් මඟින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයක සිටින යම් සතකුට කෑම සැපයීමෙහි නිරතව සිටින ;

(ඉ) සත්ව උද්‍යානය ඇතුළත, යම් ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ වෙනත් යම් ශබ්දෝපකරණයක් පාවිච්චි කිරීම දැන්වීමක් මඟින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයක එවැනි ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ ශබ්දෝපකරණයක් පාවිච්චි කරන ;

(ඊ) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සත්ව උද්‍යානය ඇතුළත ඡායාරූපී උපකරණ පාවිච්චි කරන ;

(උ) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සත්ව උද්‍යානය තුළට යම් සතකු කැටුව යන ;

(උ) සත්ව උද්‍යානය ඇතුළත තුවක්කුවක්, පතරොමක්, යම් වෙඩි උපකරණයක් හෝ යම් විස්තරයක වෙනත් පුපුරණ ද්‍රව්‍යයක් ගෙන යන හෝ තම සන්තකයේ හෝ තම පාලනය යටතේ තබා ගෙන ඇති ;

(ඌ) යම් තුවක්කුවක් පත්තු කරන හෝ පත්තු කිරීමට තැත් කරන හෝ පුපුරණ ද්‍රව්‍ය කිසිවක් පාවිච්චි කරන ;

(එ) සත්ව උද්‍යානය ඇතුළත යම් ප්‍රදේශයකට ඇතුළු වීම, දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයකට ඇතුළු වන ;

(ඔ) සත්ව උද්‍යානය ඇතුළත යම් සතකුට සරදම් කරන, පීඩා කරන, බාධා පමුණුවන, හිරිහැර කරන හෝ තුවාල කරන නැතහොත් ප්‍රදර්ශනයට තබා ඇති යම් සතකුගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට යම් විධියකින් හානි කරවන වෙනත් යම් ආකාරයකින් ක්‍රියා කරන ;

(ඕ) සත්ව උද්‍යානය ඇතුළත සත්ව උද්‍යානයේ යම් සේවානියුක්තයකුට අවහිර කරන, තර්ජනය කරන හෝ ඔහුට බාධා කරන ;

(ක) සත්ව උද්‍යානයට අයත් යම් දේපළක් ඉවත් කරන හෝ ඊට හානි පමුණුවන ;

(ග) අධ්‍යක්ෂවරයා විසින් සපයනු ලැබ ඇති වාහන නැවතුම් පෙදෙස්වලින් පිටත වාහනයක් නවත්වා තබන ;

(ච) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සත්ව උද්‍යානය ඇතුළත යම් අත් පත්‍රිකාවක්, විශාල දැන්වීමක්, පෝස්ටරයක්, දැන්වීමක් හෝ එවැනි යම් ලේඛනයක් බෙදා හරින හෝ ප්‍රදර්ශනය කරන ;

(ජ) සත්ව උද්‍යානය ඇතුළත මෝටර් වාහන පැදවීම තහනම් කරනු ලැබ ඇති යම් පෙදෙසක මෝටර් වාහනයක් පදවන ; සහ

(ට) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සත්ව උද්‍යානය ඇතුළත යම් භාණ්ඩයක් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකුම, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වැරදි සමථයකට පත් කිරීමේ බලය.

6. (1) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ යම් වරදක්, රුපියල් සියයක් නොඉක්මවන මුදලක් භාරගැනීමෙන් සිදු කරන ලද වරද බේරුම් කිරීමේ ආකාරයෙන් අධ්‍යක්ෂවරයා විසින්, කවර වූ හෝ අවස්ථාවක, සමථයකට පත් කරනු ලැබිය හැකි ය. තවද, එවැනි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පවරනු ලැබ ඇති විට ඒ නඩුව විනිශ්චයට භාජනව ඇත්තේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණයේ නාමිත්ත අංනිට නඩු තීන්දුවට පෙර, යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ වරද සමථයකට පත් කොට ඒ නඩු පැවරීම අස් කර ගත හැකි ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ භාර ගනු ලබන මුදල, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලට බැර කළ යුතුය.

සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලට ගෙවිය යුතු දඩ මුදල් කොටස.

7. යම් වරදකරුවකු වරදකට වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේද, ඒ අධිකරණය විසින්, ඒ වරද සඳහා යම් දඩයක් පනවනු ලබන්නේ ද, එයින් එක් අඩක් නොඉක්මවන්නා වූ යම් කොටසක් හෝ සැබවින්ම අයකර ගනු ලබන්නා වූ යම් මුදල් ප්‍රමාණයකින් එක් අඩක් නොඉක්මවන්නා වූ යම් කොටසක් හෝ, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලට ප්‍රදානය කිරීමට නියම කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

## II වන කොටස

## සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල

සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල.

8. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග වශයෙන් ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) 6 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් අයකර ගනු ලැබිය හැකි සියලු මුදල් ;

(ඇ) දඩ මුදල් වශයෙන් අයකර ගනු ලැබිය හැකි සියලු මුදල් ;

(ඈ) උද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලබා ගත හැකි සියලු මුදල් ; සහ

(ඉ) කවර වූ හෝ ප්‍රභවයකින් යම් ආදායමක් වශයෙන් ලැබී වෙනත් සියලු මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) පනත ඇක්වෙන මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමතයට යටත්ව, අරමුදලින් ගෙවනු ලැබිය හැකිය :—

(අ) සත්ව උද්‍යානයට පැමිණෙන අමුත්තන්ට අනුයාත සේවා සැලසීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ;

(ආ) සත්ව උද්‍යානයේ සේවා නියුක්තයන්ට සුභ සාධන සහ දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම සැලැස්වීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ; සහ

(ඇ) නිශ්චිත වශයෙන් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය සියලු වියදම්.

(4) අධ්‍යක්ෂවරයා අරමුදලේ පරිපාලනය සඳහා වගකිව යුතු ය.

(5) අරමුදලේ ගිනුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## විවිධ

උපදේශක කාරක සභාව.

**9.** (1) සත්ව උද්‍යානය සම්බන්ධයෙන් වූ සියලු කාරණා හා ප්‍රශ්න පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීමේ සහ අමාත්‍යවරයා වෙත නිර්දේශයන් කිරීමේ කාර්ය සඳහා සභාපතිවරයා වශයෙන් අධ්‍යක්ෂවරයාගෙන් ද, වෙනත් තැනැත්තන් එකොළොස් දෙනකුගෙන් ද සමන්විත වන්නා වූ උපදේශක කාරක සභාවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) උපදේශක කාරක සභාවේ රැස්වීම්, යටත් පිරිසෙයින්, සෑම වර්ෂයකදී ම දෙවරක් පැවැත්විය යුතු ය.

(3) විධිවිධාන නියම කර නොමැති යම් කාර්ය පටිපාටිමය කාරණයක් සම්බන්ධයෙන් ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කිරීමට උපදේශක කාරක සභාවට හිමිකම් ඇත්තේ ය.

ඇතුළුවීමේ සහ ආපසු ලබා ගැනීමේ බලය.

**10.** (1) සත්ව උද්‍යානයට අයත් දේපළ බවට අදහස් කරනු ලැබූ කිසියම් සතකු යම් තැනැත්තකු විසින් තම රැකවරණයේ හෝ සන්තකයේ තබාගනු ලැබ සිටින බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට යුක්තිසහගත හේතු ඇති අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්—

(අ) එවැනි සතකු සිටිය හැකියයි විශ්වාස කිරීමට තමාට යුක්ති සහගත හේතු ඇත්නම් යම් ස්ථානයකට හෝ වාහනයකට ඇතුළුවී එය පරීක්ෂා කිරීම ; සහ

(ආ) ඒ සතාගේ සන්තකය ආපසු ලබා ගැනීම

නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ නියමයන් අනුව යම් සතකු ඉවත් කරගනු ලැබුවේ යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ රැකවරණයේ සිට ද, ඒ තැනැත්තා, එම සතාගේ සන්තකය නැවත ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම සතා තමාට අයිති බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතු වන්නේ ය.

රජයේ නිලධරයන් සඳහා ආරක්ෂාව.

**11.** මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා යම් රජයේ නිලධරයකුට විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

බාධක හා නිවාරණ.

12. මේ පනතින් තමා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කරන හෝ කාර්ය ඉටු කරන යම් තැනැත්තකුට පහර දෙන, බාධක පමුණුවන, තර්ජනය කරන, ඔහු බිය ගන්වන, ඔහුට පරිභව කරන හෝ නින්දා කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් එක්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

නියෝග.

13. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොවිය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

අර්ථ නිරූපණය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සතකු" යන්නෙන් පෘෂ්ඨවංශික හා අපෘෂ්ඨවංශික කවර වූ හෝ සතකු අදහස් වන අතර ඊට සියලු වර්ගවල පක්ෂීන්, මත්ස්‍යයන් හෝ උරගයන් ඇතුළත් වේ; තවද

"ජාතික සත්ව උද්‍යානය" යන්නට රජයේ මත්ස්‍ය තටාකය, රත්මලානේ පිහිටි සත්ව උද්‍යාන ගොවිපල සහ රඹුක්කන පින්නවල පිහිටි අලි අනාථාගාරය ඇතුළත් වේ.